# සභාපතිතුමාගේ පණිවිඩය



**වසර තුළදී පාලන ක්‍රියාපටිපාටි තවදුරටත් ශක්තිමත් කරමින්, අධ්‍යක්ෂක මණ්ඩල ඇගයීමේ ක්‍රියාවලිය යාවත්කාලීන කිරීමක් සිදු කළ අතර, උපාය මාර්ග, අවදානම් සහ තිරසරභාවය පිළිබඳව කමිටු මට්ටමේ ගැඹුරු අධීක්ෂණයක් සිදු කරන ලදී.**

GUIDED

Sinhala and Tamil Translation

හිතවත් පාර්ශවකරුවන් වෙත,

ඉදිරි වසර තුළ දී කාර්ය සාධනය තිරසාරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පදනම් ශක්තිමත් කරමින්, විධිමත්ව ක්‍රියාත්මක වීම අඛණ්ඩව පවත්වාගෙන යන්නට යෙදුන වසරක් අවසන් වූ මෙම අවස්ථාවේ දී, මෙම පණිවිඩය ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙමි. 2025 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගමේ 11 වන ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සහ විගණන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම මා හට ලැබුනු වරප්‍රසාදාත්මක අවස්ථාවක් වන අතර එම කාල පරිච්ඡේදය තුළ අපගේ කාර්ය සාධනය, පාලන ක්‍රියාපටිපාටි සහ ගොඩනගාගන්නා ලද වටිනාකම් පිළිබඳව සවිස්තරාත්මක කරුණු මෙහි දක්වා ඇත.

සමාලෝචනයට ලක් වූ වසර තුළ, ශක්තිමත් මූල්‍ය මෙහෙයුම් කාර්ය සාධනයක් දක්නට ලැබුන අතර සමාගමේ සමස්ත දළ ලිඛිත වාරික සහ බදු පෙර ලාභය අනුරූපව 18.96% කින් සහ 11.55% කින් වැඩි විය. ජීවිත අරමුදල රුපියල් බිලියන 201.81 දක්වා වැඩි වූ අතර, සමස්ත වත්කම් රුපියල් බිලියන 287.02 ඉක්මවා ගොස්, අපගේ ශේෂ පත්‍රයේ ස්ථායිත්වය තවදුරටත් ශක්තිමත් කළේ ය. අඛණ්ඩව 22 වන වසරටත්, සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගම විශිෂ්ටත්වය, මූල්‍ය ශක්තිය සහ පාරිභෝගික විශ්වාසය මත ගොඩ නැගෙමින් ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ කර්මාන්තයේ අවිවාදිත වෙළඳපොළ නායකයා ලෙස තම ස්ථානය පවත්වාගෙන ගියේ ය. මෙම වසර තුළ SLIM Kantar ජනතා සම්මානයෙන් පිදුම් ලබමින් "වසරේ ජනතා ජීවිත රක්ෂණ සේවා සැපයුම්කරු සම්මානය" දිනාගත් අතර, එය අඛණ්ඩව 19 වන වරටත් අප සමාගම ලැබූ ජයග්‍රහණයකි. එමෙන්ම, 2025 Brand Finance Sri Lanka ශ්‍රේණිගත කිරීම්වලට අනුව, ශ්‍රී ලංකාවේ වටිනාම රක්ෂණ වෙළඳ නාමය ලෙස ද සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගම නම් කරන ලදී. මෙය අපගේ වෙළඳ නාම ශක්තිය සහ සේවා විශිෂ්ටත්වය තවදුරටත් තහවුරු කරයි.

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ, වාර්තාකරණයේ විනිවිදභාවය, වගවීම සහ තිරසරභාවය වෙනුවෙන් සමාගම සතු වූ නොසැලෙන කැපවීම ප්‍රමුඛ පෙළේ කර්මාන්ත ජාලා විසින් ඇගයීමට ලක් කරන ලදී. අප විසින් 2025 TAGS සම්මාන උළෙලේදී, රක්ෂණ අංශයේ (දළ ලිඛිත වාරිකය රු.බිලියන 10ට වැඩි) රිදී සම්මානයෙන් පිදුම් ලැබූ අතර එය අප ලැබූ ගෞරවයකි. මෙය අපගේ ඒකාබද්ධ වාර්තාකරණ පිළිවෙත්වල පැහැදිලි බව සහා විශ්වසනීයත්වය පිළිබිඹු කරයි. ඊට අමතරව ACCA Sustainability Reporting Awards 2025 හි දී "වෙනත් මූල්‍ය සේවා" කාණ්ඩයේ ජයග්‍රාහකයා වශයෙන් අප සමාගම තේරී පත් විය. මෙකී පිළිගැනීම් සහ සම්මාන මගින් අප සමාගම විසින් එය තුළ ඉහළම පාලන මට්ටමක් සහ විනිවිදභාවයක් පවත්වාගෙන යාමට කරන කැපවීම සහ පාර්ශවකරුවන්ගේ විශ්වාසය යලි යලිත් තහවුරු කර ගනිමින් සමාගමේ තිරසර බව රැක ගැනීමට සමාගම දරන කැපවීමත් නැවත නැවතත් තහවුරු කරයි.

### ස්ථාවරත්වය, ප්‍රතිසංස්කරණ සහ නව ප්‍රබෝධය

2025 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධනය තවදුරටත් ශක්තිමත් වූ අතර වසරේ මුල් මාස නවය තුළ දළ දේශීය නිශ්පාදනය වසරින් වසර 5% කින් වර්ධනය විය. මෙම පරිවර්තනය කර්මාන්ත අංශයේ අඛණ්ඩ ප්‍රතිසාධනය සහ සේවා අංශයේ ස්ථිර වර්ධනය මගින් මෙහෙයවුණ අතර, පුද්ගලික පරිභෝජනය ඉහළ යාම සහ ආයෝජන වැඩි දියුණු වීම ද ඒ සඳහා සහය විය. 2024 සැප්තැම්බර් මාසයෙන් ආරම්භ වූ අවපාත ප්‍රවණතා හේතුවෙන්, උද්ධමනය 2025 අගෝස්තු මාසයේ දී නැවත ධනාත්මක මට්ටම් වෙත පැමිණි අතර, පහළ එක් අංකීය මට්ටමක ස්ථාවර විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන ගිය දිගු කාලීන අවම මිල මට්ටම් හේතුවෙන්, ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ඔවුන්ට හැකි විය. පොලී අනුපාතවල සිදු වූ සමුච්චිත අඩු

කිරීම් හරහා, ණය සහ තැන්පතු පොළී අනුපාත අඛණ්ඩව පහළ යාමට මෙය බලපාන ලදී.

ජීවිත රක්ෂණ අංශය සඳහා මෙම සංවර්ධන විවිධ පැතිකඩවලින් බලපෑම් ගෙන එන ලදී. අඩු පොළී අනුපාත සහ වැඩිදියුණු වූ ණය ප්‍රවාහ මගින් ගෘහස්තයන්ගේ ගෙවීම් හැකියාව සහ දිගුකාලීන ඉතිරි කිරීමේ හැකියාව ශක්තිමත් වූ අතර ස්ථාවර වූ උද්ධමනය හේතුවෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආදායම් දෘශ්‍යතාවය වැඩි දියුණු වී එය ඔවුන්ගේ මූල්‍ය ස්ථාවරත්වයට සහ දිගු කාලීන මූල්‍ය සැලසුම්වලට ධනාත්මකව බලපා ඇත. ඒ සමගම, වැඩි වන පොළී අනුපාත පරිසරය තුළ ආයෝජන ලාභ සීමා ආරක්ෂා කරගැනීමට සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ප්‍රතිලාභ ආරක්ෂා කිරීමට විධිමත් වත්කම්-බැරකම් කළමනාකරණයක් අවශ්‍යව ඇත.

ශ්‍රී ලංකාව තුළ ජීවිත රක්ෂණ ප්‍රවේශය කලාපීය මට්ටම්වලට සාපේක්ෂව තවමත් අඩු මට්ටමක පවතී. කෙසේ වුවත්, මෙම කර්මාන්තය වර්තමානයේ දී, පරිවර්තන කාලපරිච්ඡේදයක් තුළ ගමන් කරමින් පවතින අතර එය තරගකාරී ව්‍යාපෘති නැවත හැඩගස්වමින්, වැඩි කාර්යක්ෂමතාවයක්, නව්‍යකරණයක් සහ පාරිභෝගික මධ්‍යස්ථභාවයක් අනුව ගමන් කරන ස්වභාවයක් පෙන්නුම් කරයි.

මූල්‍ය දැනුම වැඩි වීමත්, සුවසම්පන්න භාවය පිළිබඳව පවතින වැඩි අවබෝධයත් සමග, මූල්‍ය ආරක්ෂණ විසඳුම් වෙත පාරිභෝගිකයන් යොමු වීමෙහිලා නව ප්‍රවණතාවයක් මේ වන විට ඇති වී ඇති අතර ඩිජිටල් මාධ්‍ය හරහා පාරිභෝගික අන්තර්ක්‍රියා පරිවර්තනය කරමින් පවතී. දිගු කාලීන මූල්‍ය ආරක්ෂාවක් ලෙස ජීවිත රක්ෂණයේ වැදගත්කම ඉහළ යාම පෙන්නුම් කරමින් දළ ලිඛිත වාරික 23%කින් වර්ධනය වෙමින් මෙම ක්ෂේත්‍රය වසර තුළ ඔරොත්තු දීමේ හැකියාවක් සහ ස්ථාවර ව්‍යාප්තියක් පෙන්නුම් කරන ලදී. මෙම කාල සීමාව තුළ ඉල්ලීම් 25% කින් ඉහළ ගිය අතර, රක්ෂිතයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට මූල්‍ය ආරක්ෂාව සැලසීමේ ක්ෂේත්‍රයේ මූලික වගකීම නැවත තහවුරු කරන ලදී. ඉහළ ඉල්ලීම් මගින් ප්‍රතිලාභ භාවිතය වැඩි වීම පිළිබිඹු වන අතරම, එමගින් වගකීම් ඉටු කිරීමට සහ විශ්වාසය තහවුරු කිරීමට කර්මාන්තයට ඇති හැකියාව ද පෙන්නුම් කරයි.

## විධිමත් උපායමාර්ගයන් මගින් කාර්යසාධනය ලබා දීම

සමාගම, වසර තුළ ප්‍රශංශනීය කාර්යසාධනයක් ලබා ගනිමින්, වාර්ෂික පදනමින් දළ ලිඛිත වාරික 18.96% කින් ද, බදු පෙර ලාභය 11.55% කින් ද ඉහළ යාමක් වාර්තා කර ඇති අතර, එමෙන්ම වෙළඳපොළ නායකත්වය ද රඳවාගෙන ඇත. ශක්තිමත් ප්‍රාග්ධන මට්ටම් ද පවත්වා ගනිමින්, ශේෂ පත්‍ර ශක්තිමත්භාවය සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ සුරක්ෂිතභාවය සහතික කිරීමටත් සමාගම විසින් කටයුතු කර ඇත. සමාගමේ කාර්යසාධනය පිළිබඳව විස්තරාත්මක විමර්ශනය මෙම වාර්තාවේ 36-41 පිටුවල ඇති ප්‍රධාන විධායක නිළධාරීගේ වාර්තාවේ සඳහන් වේ.

අප විසින් අපගේ උපායමාර්ගික අවධානය පැහැදිලිව සහ ක්‍රියාකාරිත්වය මත පදනම්ව පවත්වාගෙන යන ලදී. තාක්ෂණය මගින් සක්‍රිය වූ කාර්යක්ෂමතාවයන් මගින් සනාථ කරනු ලබන විධිමත් පිරිවැය කළමනාකරණය සහ වැඩිදියුණු කළ එලදායිතාවය හරහා මෙහෙයුම් විශිෂ්ටත්වය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ඩිජිටල් ආයෝජන අදාළ අංශ ඔස්සේ වඩාත් ශක්තිමත් සහ වඩාත් එලදායී ක්‍රියාත්මක කිරීමක් ලෙස පරිවර්තනය විය. පාරිභෝගික අදාලතාවය අපගේ ප්‍රවේශයේ මූලික කේන්ද්‍රය ලෙස පවත්වා ගනිමින්, වැඩිවන පාරිභෝගික අවශ්‍යතා සහ ප්‍රවණතාවලට ගැළපෙන ලෙස අපගේ ආරක්ෂණ හා ඉතිරිකිරීම් යෝජනා පුළුල් කරන ලදී. අපගේ ප්‍රධාන නියෝජිත ජාලය තුළ බෙදා හැරීමේ පරාසය ශක්තිමත් වූ අතර මාර්ගගත මූල්‍ය උපදේශක නාලිකාව ඉලක්කගතව එකී පුළුල් කිරීම සිදු විය. මෙම ව්‍යාපෘතීන් පිළිබඳව මෙම වාර්තාවේ 36-41 පිටුවල ඇති ප්‍රධාන විධායක නිළධාරීගේ වාර්තාවේ තවදුරටත් විස්තර කර ඇත.

## අඛණ්ඩතාවය සහ අධීක්ෂණය

සමාගමේ ස්ථායිතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා ශක්තිමත් පාලන ක්‍රමවේද මූලික වන අතර, සදාචාරාත්මකභාවය, වගවීම සහ අඛණ්ඩතාවය පිළිබඳව සම්මුති විරහිත ප්‍රමිති ඉහළ නැංවීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන්ම කැප වී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම සාමාජික සංඛ්‍යාව 15 සිට 17 දක්වා වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය අප විසින් ලබා ගෙන ඇත. මෙම වැඩි දියුණු කිරීම, පුළුල් විශේෂඥතාව, විවිධ අදහස් සහ ගැඹුරු කර්මාන්ත දැනුම එක් කරමින්, සමාගම දීර්ඝකාලීන උපායමාර්ගික දිශාවකට මගපෙන්වීම සඳහා පාලනය ශක්තිමත් කිරීම සඳහා වන අපගේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි.

මෙම සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස, පුළුල් නියෝජනයක් සහ වඩාත් එලදායී අධීක්ෂණයක් සහතික කිරීම සඳහා මණ්ඩල අනුකමිටු සංයුතිය ද නැවත සමාලෝචනය කර ඇත. ඉහළම පාලන ප්‍රමිතීන් අනුව ක්‍රියාත්මක වන මෙම කමිටු, සමාගමේ ප්‍රධාන ප්‍රමුඛතා ඉටු කර ගැනීම සඳහා ශක්තිමත් නායකත්වය සහ උපායමාර්ගික මගපෙන්වීම ලබා දීම සඳහා මණ්ඩලයට සහාය වීමේ වැදගත් භූමිකාවක් නිරන්තරයෙන් ඉටු කරයි.

ක්‍රියාකාරී අධ්‍යක්ෂක/ ප්‍රධාන මෙහෙයුම් නිළධාරී ලෙස ටී.ආර්.එස්.ජී.එස් හේමචන්ද්‍ර මහතා පත් කිරීමත්, අනෙකුත් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් ලෙස එන්.එම්. බොරලැස්ස මහත්මිය, ආචාර්ය ආර්.සී.ජේ. ෆර්ඩිනැන්ඩ්ස් මහතා සහ ආර්.ඒ.අයි.ඇලපාත මහතා පත් කිරීමත් සමග වසර තුළ මණ්ඩලය තවදුරටත් ශක්තිමත් කෙරිණි. මෙම පත් කිරීම මගින්, ස්ත්‍රී- පුරුෂ සමානාත්මතාවය, සේවා කාලය සහ වෘත්තීය පලපුරුද්ද යන ක්ෂේත්‍ර හරහා මණ්ඩලයේ සමස්ත කුසලතා පැතිකඩ සහ විවිධත්වය වැඩිදියුණු වූ අතර, තීරණ ගැනීම සහ අධීක්ෂණය යන අංශවල ගැඹුර සහ එලදායිතාවය වර්ධනය විය.

වසර තුළදී පාලන ක්‍රියාපටිපාටි තවදුරටත් ශක්තිමත් කරමින්, අධ්‍යක්ෂක මණ්ඩල ඇගයීමේ ක්‍රියාවලිය යාවත්කාලීන කිරීමක් සිදු කළ අතර, උපාය මාර්ග, අවදානම් සහ තිරසරභාවය පිළිබඳව  කමිටු මට්ටමේ ගැඹුරු අධීක්ෂණයක් සිදු කරන ලදී. මෙය වගවීම පැහැදිලි අදහසක් සහ උපාය මාර්ගික ප්‍රමුඛතා හා අවදානම් කළමනාකරණය අතර වඩාත් ශක්තිමත් සම්බන්ධතාවයක් සහතික කරන ලදී. වසර තුළ දී මණ්ඩලය 05 වරක් රැස් වී ඇති අතර එම සාකච්ඡා ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ක්ෂේත්‍රය, අවදානම් කළමනාකරණය, නියාමන සංවර්ධනයන්, සහ සංස්කෘතිය, කුසලතා සහ තිරසාරභාවය පිළිබඳව අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන ලදී. මණ්ඩලය ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා කළමනාකරණය පිළිබඳ විනයානුකූල අවධානයක් පවත්වාගෙන ගිය අතර, පොළී අනුපාත වෙනස්වීම්වලට ඇති සංවේදීතාව නිරන්තරයෙන් නිරීක්ෂණය කරමින් සහ සුපරීක්ෂිත වත්කම් වෙන්කිරීම පවත්වා ගනිමින්, අවදානම් පදනම් වූ ප්‍රාග්ධන අවශ්‍යතා සමග අඛණ්ඩ අනුකූලතාවය සහතික කරන ලදී.

ඩිජිටල් නාලිකා තවදුරටත් වර්ධනය වීමත් සමග, පාරිභෝගික දත්ත ආරක්ෂාව සහ සයිබර් ප්‍රතිරෝධශීලීතාවය ප්‍රමුඛතාවයක් ලෙස පවතින ලදී.මෙහිදී මෙහෙයුම් අඛණ්ඩතාවය සහ රක්ෂිත හිමිකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් ශක්තිමත් කරන ලදී.මණ්ඩලය, සංවිධානයේ සංස්කෘතිය සහ කුසලතා පිළිබඳ සක්‍රිය අධීක්ෂණයක් පවත්වාගෙන ගිය අතර , විශේෂයෙන් නායකත්ව සංවර්ධනය, විවිධත්වය සහ සමාගම පුරා වගකීම් ශක්තිමත් කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලදී.

## ප්‍රාග්ධන ප්‍රතිරෝධශීලීත්වය (ඔරොත්තු දීමේ හැකියාව) සහ නියාමන පෙළගැස්ම

වසර තුළ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2015 දී නිකුත් කරන ලද පවතින අවදානම් පදනම් වූ ප්‍රාග්ධන නියමයන් සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී.මහජන උපදේශක ක්‍රියාවලියක් සහ කර්මාන්තයෙන් ලැබූ ප්‍රතිචාර අනුව, වර්ධනය වෙමින් පවතින වත්කම් වෙළඳපොළ, ශ්‍රී ලංකාවේ ගතික ආර්ථික තත්ත්වයන් සහ ජාත්‍යන්තර රක්ෂණ සමීක්ෂකවරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද අවධානම් මූලික ගත් ගෝලීය

# සභාපතිතුමාගේ පණිවිඩය

රක්ෂණ ප්‍රාග්ධන මට්ටම් මගින් සිදු කළ වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, කෙටුම්පතක් නිකුත් කරන ලදී. මෙම යෝජිත වෙනස්කම්, රක්ෂණකරුවන් විසින් භාරගන්නා අවදානම් පිළිබිඹු වන පරිදි, ශ්‍රී ලංකාවේ රක්ෂණකරුවන්ගේ වගකීම් සහ ප්‍රාග්ධන ඇගයීම් ප්‍රමාණවත් ලෙස සිදු කිරීම සහතික කිරීම මත කේන්ද්‍රගත වේ.

යෝජිත අවදානම් පදනම් වූ ප්‍රාග්ධන රාමුව සඳහා සිදු කිරීමට යෝජනා කරන ලද වැඩිදියුණු කිරීම්වලට අමතරව රක්ෂණ කර්මාන්තය, රක්ෂණ කර්මාන්තය පාලනය කිරීමේ පනත සඳහා සංශෝධන පිළිබඳව මහජන උපදේශන ක්‍රියාවලියකට ද සහභාගී විය. මෙම ප්‍රතිශෝධනයන්, හිමිකම් නොලැබූ ප්‍රතිලාභ සම්බන්ධ විධාන, පරිපාලන දඩුවම්, රහස්‍ය භාවය සහ ප්‍රකාශන අවශ්‍යතා සහ නියාමනයට ලක්වන පුද්ගලයින් හා ආයතන සඳහා ශක්තිමත් සුදුසුකම සහ යෝග්‍යතාවය වැනි නිර්නායක වැනි වැදගත් ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය කරයි. යෝජිත මෙම වෙනස්කම් මූලික රක්ෂණ මූලධර්ම වැනි ගෝලීය ප්‍රමිතීන් හා නවීන වෙළඳපොළ පරිචයන් සමග සමපාත කරමින්, කර්මාන්තයේ නියාමන ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

කර්මාන්තය තුළ,පාලනය, විනිවිදභාවය සහ මූල්‍ය විනය වැඩිදියුණු කිරීම සඳහා වැදගත් පියවර ලෙස මෙම වර්ධනයන් අප සාදරයෙන් පිළිගන්නා අතරම, නියාමන ප්‍රතිසංස්කරණවල වේගය සහ ව්‍යාප්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී අභියෝග මතු කරයි. කාලෝචිත අනුකූලතාවය සහතික කිරීම සඳහා පද්ධති,ක්‍රියාවලි සහ විශේෂිත සම්පත් සඳහා සැලකිය යුතු ආයෝජනවල අවශ්‍යතාවය ද මෙයට ඇතුළත් වේ. එබැවින්, මෙහෙයුම් ප්‍රතිරෝධශීලීත්වය සහ දිගුකාලීන කර්මාන්ත වර්ධනය රඳවා ගනිමින්, සුමට සංක්‍රාන්තියකට සහය වීම සඳහා නියාමකයින් සහ කර්මාන්ත සහභාගිවන්නන් අතර අඛණ්ඩ සම්බන්ධතාවයක් අත්‍යවශ්‍ය වනු ඇත.

වසර පුරාවට, සමාගම පවතින RBC පාලන තන්ත්‍රය යටතේ ශක්තිමත් ප්‍රාග්ධන අනුකූලතාවයක් පවත්වා ගෙන ගිය අතර, උපදේශක ක්‍රියාවලියෙන් ඇතිවිය හැකි සංශෝධන සඳහා පෙර සූදානම් වීම ද ආරම්භ කර ඇත.

සමාගමේ ප්‍රාග්ධන තත්ත්වය, භාරගත් අවධානම්වලට සමානුපාතිකව සහ විචක්ෂණශීලී ශේෂ පත්‍ර කලමනාකරණයට අනුකූලව පවතින අතර මෙම ශක්තිය පිළිබිඹු කරමින්, වසර අවසානයේදී සමාගමේ අවදානම් පදනම් වූ ප්‍රාග්ධන ප්‍රමාණිත අනුපාතය 432%ක් වූ අතර, එය නියාමන අවම අවශ්‍යතාවය වන 120%ට වඩා සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී. මෙම ප්‍රාග්ධන ශක්තිය, අපගේ මූල්‍ය ස්ථාවරතාවයේ ප්‍රතිරෝධශීලිත්වය සහ විකාශනයවන නියාමන හා වෙලදපොළ තත්ත්වයන් විශ්වාසයෙන් යොදා ගැනීමට ඇති හැකියාව අවධාරණය කරයි.

## සම්බන්ධ පාර්ශවයන් සඳහා වටිනාකම සැපයීම

සමාගම විසින් එහි කොටස්කරුවන් සඳහා ශක්තිමත් ස්ථාවර ප්‍රතිලාභ ලබා දීම අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇති අතර, සමාගමේ විනයානුකූල මූල්‍ය ප්‍රාග්ධන කළමනාකරණය සහ ස්ථායී ලාභදායකතාවය මගින් ඊට සහය ලබා දී ඇත.

කොටස්කරුවන්ගේ ප්‍රාග්ධන අනුපාතය 11.56% ක් ලෙස පවත්වාගෙන ගොස් ඇති අතර, 2024 වසරේ එය 11.64% ක් වූ අතර ඒ සමග සසඳන විට මෙය ඉහළ ආදායම් ක්‍රියාකාරීත්වයක් සහ ප්‍රග්ධනය කාර්යක්ෂම ලෙස යෙදවීමක් පෙන්නුම් කරයි.

එක් කොටසකට ලාභය පෙර වසරේ රුපියල් 141.43 සිට රුපියල් 156.94 දක්වා වැඩි වී ඇති අතර, එය සමාගමේ ආදායම් වර්ධන ගමනේ ශක්තිය තහවුරු කරයි.කොටස්කරුවන්ට අඛණ්ඩ ප්‍රතිලාභ ලබාදීමටත්, ඒ සමගම මූල්‍ය ස්ථායිතාවය සහ දිගුකාලීන තිරසරභාවය රැකගැනීමටත් සිදු කරන ලද අපගේ කැපවීම අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2025 මූල්‍ය වර්ෂය සඳහා එක් කොටසකට රුපියල් 19.60ක අවසන් ලාභාංශයක් යෝජනා කර ඇති අතර, එය ඉදිරියේ පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස්කරුවන්ගේ අනුමැතියට යටත් වේ.

2025 වසර තුළ ගණුදෙණුකරුවන්ගේ අපේක්ෂා ඉටුවීම් ඉහළ ගොස් ඇති අතර, එය අපගේ සේවා ප්‍රමිතීන්හි ස්ථායිභාවය පිළිඹිඹු කරයි.

ඉලක්කගත සේවා උත්කර්ෂතා වැඩසටහන්, පුහුණු කටයුතු සහ වර්ධිත ඩිජිටල් හැකියාවන්ගේ සහය මත, අපි සියලුම නාලිකා හරහා අඛණ්ඩ, වේගවත් සහ ප්‍රතිචාරාත්මක සම්බන්ධතාවයක් ලබා දීමට කැප වී සිටිමු.

මෙම වසර තුළ අපගේ ප්‍රධාන ගනුදෙණුකරුවන් සමග ඇති සම්බන්ධතාවය වැඩි දියුණු කරමින් දුරස්ථ සහ එකතු කිරීමේ ක්‍රියාවලි සරල කර ඇති අතර ඉලෙක්ට්‍රොනික ලේඛන භාවිතට සහ ඩිජිටල් ස්වයං-සේවා වෙත පරිවර්තනය වේගවත් කර ඇත. මෙම වැඩසටහන් මගින් කාලය ඉතිරි වීම, නිරවද්‍යතාවය වැඩිදියුණු කිරිම සහ ප්‍රවේශය පහසු වීම සිදු වේ.

අපගේ සේවකයන් අපගේ ක්‍රමෝපායික ක්‍රියාත්මක කිරීමේ නියමුවන් වන අතර, පාරිභෝගික අත්දැකීම් හැඩගස්වන අපගේ සන්නාමයේ නියෝජිතයන් ද වේ. වසර පුරා වගකීම සහ සහයෝගීතාවය මත පදනම් වූ කාර්ය සාධනය පදනම් කරගත් සංස්කෘතියක් තවදුරටත් ශක්තිමත් කිරීමට අපි පියවර ගත්තෙමු. විස්තීර්ණ හැකියාවන් සහ ස්වයංක්‍රීයකරණය මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරමින්, පරිපාලන බර අඩු කර සේවකයන්ට වැඩි වටිනාකමක් ඇති කාර්යයන් සඳහා වැඩි කාලයක් යෙදවීමට හැකියාව ලැබී ඇත. නායකත්ව හැකියාවන් සංර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම ද අපගේ ප්‍රමුඛතා අතර පැවති අතර, මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා ව්‍යුහගත සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් ගැඹුරු හැකියාවන්, අනුප්‍රාප්ති සූදානම් සහ ක්‍රියාත්මක කිරීමේ විනය වර්ධනය කිරීමට කටයුතු කර ඇත.

## දිගුකාලීන ස්ථායිභාවය සඳහා තිරසාරභාවය ඒකාබද්ධ කිරීම

සමාජීය හා පාරිසරික අවදානම් ව්‍යාපාර කාර්යසාධනය සහ නියාමන අපේක්ෂාවන්ට වැඩි වශයෙන් බලපෑම් කරන බැවින්, සමාග මේ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සඳහා තිරසාරභාවය අත්‍යවශ්‍ය අංශයක් ලෙස පවතී.

වසර පුරා, අපගේ ක්‍රියාවලීන් සහ තීරණ ගැනීමේදී පාරිසරික, සමාජීය සහ පාලන කරුණු ඇතුළත් කරමින් ව්‍යාපාරයේ මූලික ක්ෂේත්‍ර හරහා පාරිසරික, සමාජීය සහ පාලන ඒකාබද්ධ කිරීම අඛණ්ඩව ප්‍රවර්ධනය කළෙමු. තවදුරටත් ඉදිරියට ගෙන ගොස්, මෙම සංකල්පයන් අපගේ ක්‍රියාවලි සහ තීරණ ගැනීම තුළ ස්ථාපිත කර ඇත.ජාතික සහ ජාත්‍යන්තර තිරසාර ඉලක්ක සමග සමපාත වු හරිත මූල්‍ය ව්‍යාපෘති සඳහා සහභාගී වීම ඇතුළුව වගකීම් සහගත ආයෝජන ප්‍රමුඛතාවයක් ලෙස පැවති අතර, සමාගමේ මෙහෙයුම් පාරිසරික පාදසටහන් අඩු කිරීම සඳහා පාරිසරික පියවර ද ශක්තිමත් කර ඇත. ඒ සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය, පුනර්ජනනීය බලශක්තිය භාවිතය සහ සම්පත් කාර්යක්ෂමතාවය පිළිබඳව ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

එසේම 2024 වසරේ සිට ස්වේච්ජා පදනමක් මත S1 සහ S2 තිරසාර අනාවරණ ප්‍රමිතීන් යටතේ වාර්තාකරණය ආරම්භ කර ඇති අතර, ඉදිරි වසරවලදී සම්පූර්ණ අනුකූලතාවය සපුරාලීමට අපගේ අනාවරණ ක්‍රමවේදයන් තවදුරටත් සංවර්ධනය කරනු ඇත.

ඒ අනුව 2025 වසරේදී අපි අපගේ අවදානම් කළමනාකරණ දෘෂ්ටිය පුලුල් කරමින්, තිරසාරභාවය සම්බන්ධ අවදානම් සහ අවස්ථා සම්පූර්ණයෙන්ම ව්‍යාපාරික අවධානම් කළමනාකරණ රාමුවට ඒකාබද්ධ කර ඇත. මෙය SLFRS S1 සහ S2 මගින් ඉදිරිපත් කරනු ලබන මූලධර්ම සමග සම්මුඛ වේ.

මෙම සංවර්ධනය දේශගුණික කරුණු පමණක් නොව විශාල පරාසයක පාරිසරික, සමාජීය සහ පාලන මානදණ්ඩයන් ඇතුළත් කරමින්, ඒවා සාම්ප්‍රදායික මූල්‍ය හා මෙහෙයුම් අවදානම්වලට සමාන මට්ටමකින් ඇගයීමට සහ

කළමනාකරණය කිරීමට හැකි වන පරිදි සකස් කර ඇත.

අපගේ නවීකරණය කළ ERM ප්‍රතිපත්තිය තුළ, තිරසාර අවදානම් කළමනාකරණ සඳහා සංවිධානය පුරා පාලන ව්‍යුහ, භූමිකා සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කර ඇති අතර, එය අධ්‍යක්ෂක මණ්ඩලයට දිගුකාලීන ස්ථායිභාවය පිළිබඳව සමාජ අධීක්ෂණයක් සිදු කිරීමට හැකියාව ලබා දෙයි.

## ඉදිරි පියවර

උද්ධමනය ස්ථාවර වීම, පොලී අනුපාතය පහල යාම සහ ආර්ථික වර්ධනය අලුත් වීම ඇතුළු ආර්ථික මූලධර්මවල යහපත් වර්ධනයත් සමගින්, ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරි දැක්ම ඉතා හිතකර ලෙස පවතී.

ගෘහස්ථ ආදායම් නැවත ප්‍රතිස්ථාපනය වීම සහ ව්‍යාපාරික විශ්වාසය වර්ධනය වීමත් සමග, ව්‍යුහගත ආරක්ෂණය සහ දිගුකාලීන ඉතිරි කිරීමේ විසඳුම් සඳහා ඇති ඉල්ලුම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ප්‍රවේශය තවමත් සාපේක්ෂව අඩු මට්ටමක පවතින නමුත් එය දිගු කාලීන වශයෙන් විශාල වර්ධනයක් හැකියාවක් ඉදිරිපත් කරයි.වෙනස්වන පරිසරය තුළ ව්‍යුහාත්මක අවස්ථා බොහෝමයක් දක්නට ලැබෙන අතර, උදාහරණයක් ලෙස කෘතිම බුද්ධිය යොදා ගැනීම මගින් වඩාත් නිවැරදි අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලි සහ වැඩි දියුණු කළ සේවා සැපයීම සක්‍රිය කළ හැකි වන අතර ඒ සමගම දත්ත ආරක්ෂාව පිළිබඳව දැඩි ආරක්ෂණ ක්‍රමවේද පවත්වාගෙන යාම ද අත්‍යවශ්‍ය වේ.

එමෙන්ම, ඩිජිටල් තාක්ෂණයට හුරු තරුණ පිරිසක් වැඩිවීම සහ වයෝවෘද්ධ ජනගහනය වර්ධනනය වීම වැනි ජනගහන වෙනස්කම්, අපගේ නිෂ්පාදන යෝජනා, බෙදාහැරීමේ මාදිලි සහ සම්බන්ධතා උපාය මාර්ගයන් මත බලපානු ඇත.

අනාගතය පිළිබඳ ආශාවෙන් අප ඉදිරියට යමින්, ආරක්ෂණ සහ විශ්‍රාමික විසඳුම් ක්ෂේත්‍රයේ අපගේ නායකත්වය තවදුරටත් ශක්තිමත් කිරීමටත් උසස් ගුණාත්මක බෙදාහැරීමේ සහයෝගීතා වැඩිදියුණු කිරීමටත් සහ විකල්ප නාලිකා පුලුල් කිරීමටත් අපි කටයුතු කරමු. නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, ගණුදෙණුකරුවන් සමග සබදතා ගැඹුරු කිරීම සහ පවතින ගිවිසුම් පවත්වා ගැනීම ශක්තිමත් කිරීම මගින් ස්ථාවර ආදායම් ලබා ගැනීම අපගේ ප්‍රමුඛතා අතර පවතිනු ඇත.

එසේම තාක්ෂණ නවීකරණය, ඩිජිටල් සක්‍රියකරණය සහ ශක්තිමත් අවදානම් කලමනාකරණ රාමු තුළ ආයෝජනය කරමින්, සංවිධානයේ ස්ථායිභාවය තවදුරටත් ශක්තිමත් කරමින් මෙහෙයුම් අඛණ්ඩතාවය ආරක්‍ෂා කිරීමට අප බලාපොරොත්තු වෙමු.

එමෙන්ම 2026 ජනවාරි 1 දිනෙන් පසු වාර්තාකරන කාලසීමා සඳහා අනිවාර්ය වන SLFRS 17 සහ SLFRS 9 වෙත කර්මාන්තය පරිවර්තනය වීමට අප විසින් කරනු ලබන සැලසුම්ගත සූදානම් වීම අඛණ්ඩව කරගෙන යන්නෙමු. අපගේ ස්ථාපිත මාර්ග සටහන අනුව, 2026 තුන්වන කාර්තුව වන විට සම්පූර්ණ අනුකූලතාවය ලබා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු. එමගින් නව ප්‍රමිතීන් යටතේ පළමු විගණිත මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට සූදානම් වීම පිළිබඳව අප සහතික වේ.

මෙම පරිවර්තනය මගින් පාරදෘශ්‍යභාව තවදුරටත් වැඩි කරමින්, ආයෝජකයන්ට සහ සම්බන්ධ පාර්ශ්වයන්ට ලබා දෙන මූල්‍ය අනාවරණවල ගුණාත්මකභාවය ශක්තිමත් කරනු ඇත. නව RBC රාමුව ද ආසන්න වශයෙන් අනාගතයේදී අප අනුගමනය කිරීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා වන නියාමන කාලසීමාවන්ට අනුකූල වීම සහතික කරමු.

## ස්තූතිය

අපගේ කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිළධාරී තුෂාර රණසිංහ මහතා, නායකත්ව කණ්ඩායම් සහ සෙලින්කෝ ලයිෆ් හි සියලුම සේවකයන් වෙත වසර පුරා දැක්වූ කැපවීම සහ වෘත්තීය භාවය වෙනුවෙන් මාගේ ස්තූතිය පුද කර සිටිමි. එසේම රටපුරා ක්‍රියාත්මක වන අපගේ විකුණුම් බලකාය ද පිලිගනිමින්, ඔවුන්ගේ කැපවීම සහ විනයානුකූල ක්‍රියාත්මක කිරීම අපගේ වෙලදපොළ නායකත්වය පවත්වාගෙන යාමට සහ ගණුදෙණු කරුවන් සමග සබදතා ශක්තිමත් කිරීමට මූලික බලවේගයක් වූ බව අවධාරණය කරමි.

අපගේ රක්ෂණ ඔප්පු හිමියන් වෙත මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි. ඔවුන්ගේ විශ්වාසය අපට උසස් සේවා මට්ටමක් සහ විශ්වසනීයභාවය අඛණ්ඩව පවත්වාගෙන යාමට ඉවහල් විය. එසේම අපගේ මව් සමාගම වන සෙලින්කෝ හෝල්ඩින්ගිස් පී.එල්.සී. උප සමාගම් සහ සම්බන්ධිත සමාගම් වෙත ද  අපගේ ස්තූතිය පිරිනමමු. ඔවුන්ගේ ඒකාබද්ධ ශක්තිය ශ්‍රී ලංකාව පුරා සෙලින්කෝ ලයිෆ් වෙළඳ නාමයේ පරාසය, ස්ථායිභාවය සහ පිළිගැනීම තවදුරටත් වර්ධනය කරයි.

එසේම, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, අනෙකුත් නියාමන ආයතන අපගේ රක්ෂණ සමාගම්, උපදේශකයන්, උපදේශන සහයෝගීතාකරුවන් සහ සියලුම සම්බන්ධ පාර්ශ්වයන් වෙත ඔවුන්ගේ අඛණ්ඩ සහාය සහ මගපෙන්වීම වෙනුවෙන් මාගේ ස්තූතිය පුද කර සිටිමි.

මෙම වසර තුළ දිගු කාලීන සේවාවකින් පසු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විශ්‍රාම ගත් ඩබ්.ඩබ්.එල්.ආර්.ඒ. ප්‍රනාන්දු මහතා සම්බන්ධව ගත් කළ ඔහු විසින් සමාගමේ ප්‍රගතිය සඳහා ලබා දුන් අගනා දායකත්වය, ඥානවත් උපදේශනය සහ අඛණ්ඩ කැපවීම වෙනුවෙන් අපගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කරමි. අවසානයේ ශක්තිමත් පාලනය සහ දිගු කාලීන වටිනාකම් නිර්මාණය සඳහා ඔවුනගේ උපදේශනය, අධීක්ෂණය සහ ස්ථිර කැපවීම වෙනුවෙන් අධීක්ෂණය සහ ස්ථිර කැපවීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සගයන් වෙත ද මාගේ ස්තූතිය පිරිනමමි.



**ආර්. රෙන්ගනාතන්**

විධායක සභාපති

2026 පෙබරවාරි 25
කොළඹ